## ජන ගායනා වල සමාජ සංස්කෘතික පසුබිම හදුනා ගනිමු.

### ග්‍රහ පන්ති කවි

නවග්‍රහයින්ගෙන් ඇතිවන්නා වූ අපල උපද්‍රව දුරු කර ගැනීම සදහා පවත්වනු ලබන සම්ප්‍රදායන් ත්‍රිතවයටම පොදු වූ ශාන්ති කර්මයක් ලෙස හදුන්වනු ලබන බලි ශාන්ති කර්මයේ එන ගායනා විශේෂයකි.හිරු,සඳු,කුජ,බුධ, ගුරු, සිකුරු,සෙනසුරු, රාහු,කේතු,යන ග්‍රහයින් නව දෙනාට අයත් දිශා,විමාන(වෘක්ෂ) ආයුධ,භෝජන,වාහන,දින,පිළිඹදවමෙම ගායනාවල සදහන් වේ.

ඉරු සිකුරු අගහරු - රාහුද සමග සෙනසුරු

රවි බුධ කේතු ගුරු - මෙකී නව දෙන රකිති නිරතුරු

- මෙම ග්‍රහ පන්ති කවි මගින් ග්‍රහයන්ට ආරාධනා කිරීම හා ආතුරයාට සෙත් පැතීම සිදු කරනු ලැබේ.එකී ගායනා ඇසීමෙන් රෝගී මනසට මානසික සුවයක් ලැබෙන බව විශ්වාස කෙරේ.
- බලි ශාන්ති කර්මයේදී ගායනයට මුල් තැනක් හිමිවන අතර විවිධ තිත් මාත්‍රා අනුව ඉතාමත් මිහිරි හඩින් හා ලයාන්විතව ගැයෙන ග්‍රහ පන්ති කවි විශාල ප්‍රමාණයක් අන්තර්ගතය.
- ග්‍රහයන් නවදෙනා වෙනුවෙන් සම්ප්‍රදායන් ත්‍රිත්වයට විශේෂිත වූ නාද මාලාවන්ට අනුව ගායනයේ යෙදෙයි.

- කවි ගායනයේදී අත්මිණිය(ගගණය) අත්‍යවශ්‍ය තාල වාද්‍ය භාණ්ඩයක් ලෙස භාවිතා කෙරේ. . 

- දකුණු අතට අත්මිණිය ගත් බලි ඇදුරා  බෙර වාදනයට අනුව තාලානුකූලව ගායනා කරමින් සරල නර්තනයක යෙදේ.
- ගායනයට මුල් තැන දෙමින් වාදනයේදී හඬ පාලනය කිරීමද මෙහි විශේෂත්වයයි.

මාත්‍රා 4 තනි තිත

ඉන්ද්‍ර දිසාවට ඉඹුල් විමානෙට හිරු දෙවි අධිපති        වන්නේ

රන්සිරිවස ගෙන සුරත දරාගෙන තුරගෙකු පිට වැඩ   ඉන්නේ

ඇතියම් රෝ දුක් දුරැර දමා නිති විරත් කලක් වැජ     බෙන්නේ

ඉන්ද්‍ර දිශාවෙන් හිරුදෙවි වැඩලා ග්‍රහ මේ දොස දුර     ලන්නේ

මාත්‍රා 3 තනි තිත

කොකුම්පාට කිතුලින් බත් වළඳා ඉදුරට                හිමිවන

අතින් රැගෙන සිරිවසකුත් තුරගුන් නැගි ඉඹුල්       විමන

නිතින් පැමිණ එන උවදුරු ඉරිදා මුල් කොට          අරගෙන

දුකින් මුදා සැපත ලැබෙයිඉරු සෙත් දී                  ආවඩන

පැවරුම:-

1 ග්‍රහ පන්ති කවි ඇතුලත් ශාන්ති කර්මය කුමක්ද?

2 එය පැවැත්වීමට හේතුව කුමක්ද?

3 මෙම ගායනාවල සුවිශේෂී ලක්ෂණ මොනවාද?

4 බලි ඇදුරාගේ අත ඇති තාල වාද්‍ය භාණ්ඩය කුමක්ද?

5 ග්‍රහයන් නවදෙනා නම් කරන්න.